

# වම් ඉවුරේ මිනිස්සු

රාජාංගනේ මතක සටහන්

## අදින් පස් දොහකට එහා හෙනහුරාදා.. මං එන්නං උඹ කැටුං යන්ට..

"ඕන් බැහැල යමං මාමා.. මේක තමයි කුරප්පට්ටුව ගහන උන්දලාගේ ගෙදර.."

"නෑම්බියක් නං වැට ඉම ඉන්නේ.. මහ එව්වො නැතුවා වක්ද?"

"ඉඳිං මං අහන්නං.. නගා උඹලගේ අපුච්චා කොහේ..?"

"ඔහොම ඉඳ.. මං අඩගහඤ්ඤදං.. අපුච්චේ.. අපුච්චේ.. මේ බෝ හදි ගැහෙන්ට ගොබ්ලෙක් වැට ඉම.. විලැහින් වරේන්..."

තරුණියගේ අඬගැසීමට අප දෙසට ආවේ කොයින් මාමාගේම වයසේ මාමා කෙනෙක්. බුලත් කහට වැදුණ දත් පෙන්නා බොමොහ අහිංසක ලෙස හිනා වී හිස බැඳි තලප්පාව අතට ගෙන ගරු සරු ඇතිව අප දෙසට ආවේ මෙහෙම අසමින්.

"ඔය ඇත්තෝ අහවල් දේකට යැ හේන් ඉම මහරාලත් කැටුව..?"

"බෝව හදි ගැහෙන්ට ආවේ මාමා අපේ කාරණාවකට"

"හොඳා පිල්කොටේට ගොඩ වුණා නං මනාප නැතුවා.. "

"මොකෑ නැතුවා මාමා.. අව්කාස්ටකේ ඇවිදින් දිව ගිලෙන්ට තරං තිබහේ බැරුවා..

"ඉඳ.. මං වෑවරයක් කපන්ඤදං.. අඩී කෙලී.. ගෙන ඔය පාලිය.. වෑවරයක් බාගන්ට.. "

වෑවරය කපා අප අතට දුන්නේ "අහවල් එකටයැ මේ කූටකේ ගමන් ගැස්සුවේ ?" යයි විමසමිනි.

"කියාපං මාමා බුලත්කොල අත දීලා උඹට වෙන්ට ඕනෑ හරිය.."

"හිට මම මේක බීලා අහවර කරනකං.."

"නිස්කාංසුවේ රාලට බොන්ට දිය.. පස්සෙන් පහු කතා කරන්ට බැරුවයැ.."

"රාල මේ බුලත් ටික අතට ගෙන හිට.."

"හොඳා හොඳා... මගේ අපුච්චා සිහිකෙරාන දං අඩුක්කුවක් හාමුදුරුගොල්ලට පූජා කොරන්ට හරි කොරනවා.. එදාට පුරප්පටුටුව අඩ තලන්ට බොට ඉස්පාසුවක් ඇතුවා.. මං උඹට කාසි මිට මොලවන්නං.."

"කාසි කතා පැත්තක තිය රාලේ.. අපි හේන් ඉම එකාලා.. කොයි දොහටද මා එන්නෙ" කිය..

අදින් පස් දොහකට එහා හෙනහුරාදා.. මං එන්නං උඹ කැටුං යන්ට.. ඉර මුඩු මහනගෙ ලෙනට උඩින් එබෙන්ට කලින් දොර පෑල ළඟ හිට.."

"හොඳා මාමා.. එහෙනං අපි ගෙහුං එන්නං..

"උඹලට කැලේ දෙයියන්ගෙම පිහිටයි.."

"රාලේ මං බෝ අත කාසි ටිකක් දැන්ම තියන්ටැ.."

"අහවල් කාසියක්ද බොලා.. ගමන් ගස්සපල්ලා.. ආයේ දෙගොඩ දෙවාරුවක් නැතුව ාමා එඤ්ඤදං.."

"යමං මාමා.. යමං.. හෙට උදේම අරකතා විහාර ගෙට යවන්ට ඕනෑ.. ඒක ද්‍රිනෙට කලින් අහවර කරන්ට ඕනෑ.. මේ ගමං සෙයිලමට ගිහින් වහලෙට ඕනෑ අඩුම නුඩුම ගන්න ඕනෑ.."

"මහතැන් බෝ වාඩියේ එකාලට විහාර ගෙට ගිහින් කරන්ට ඕනෑ හරිය පංගරාර්තු කර.. න්ත්නං ඕකලා ඩෙඟා නටයි.."

"මාමා මම කොණ්ඩ මුදලාලිගෙ කඩෙන් ඕනෑ කරන බඩු ටික ගන්නං.. උඹට ඕනෑ කරන දෙයක් හෙම තියෙයි?"

"ඒවා නිස්කාංසුවේ හොයා බලන්ට ඕනෑ අඩා.."

"වහලේ වැඩට ඕනෙ අඩුක කුඩුම අදම ගන්නවා.."

"හොඳා උඹ ඒවා එකලහක් කරගන්නකං මං ඇබින්දක් එහාට ගෙහුන් එඤ්ඤදං.."

"විගැහින් වරෙන් මාමා.".

බෝගල

"**බෝගල ගේ කතා**" දැන් තිසර ගුවන් විදුලියේ
www.sannasa.net ඔස්සේ හෝ ඔබේ දුරකතනයෙන් තිසර හා එක්වන්න


EASE YOUR TAX BURDEN, ENHANCE YOUR WEALTH

SANDAL
TAX ADVISORS PTY LTD

- TAX RETURNS
- ACCOUNTING AND BOOKKEEPING
- TAX PLANNING
- BAS AND IAS
- BUSINESS AND COMPANY REGISTRATION
- SELF-MANAGED SUPER FUND ACCOUNTING
- SET UP COMPANY, TRUST & SMSF
- FBT, WORK COVER, PAYROLL TAX, SUPERANNUATION
- BUSINESS CONSULTING

Amal Ramyanath
CPA, ACA, MBA & B.Sc
Registered Tax agent

SANDAL
SANDAL BUSINESS SOLUTIONS PTY LTD

GUSS DESIGN 9769 0099

- BUSINESS SERVICES
- PROJECT REPORTS
- BUDGET & CASH FLOW PREPARATION
- BODY CORPORATE ACCOUNTING
- FINANCIAL & MANAGEMENT REPORT
- BUSINESS PROCESS MANAGEMENT
- PROJECT EVALUATION & MANAGEMENT
- SET UP ACCOUNTING SOFTWARE
- FINANCIAL & MANAGEMENT REPORT
- BUSINESS RESTRUCTURING
- LABOUR HIRING

Namal Gomes
B.Sc. (Acct), MBA (Sri. J), ACA, ASCMA
sandalsolutions@gmail.com

PROFESSIONAL, FRIENDLY & PERSONALIZED SERVICE

66 Princess Highway
Dandenong VIC 3175
Tel 8707 5542
Mob 0451 698 725

Branch - 31 Madeline St Glen Waverley VIC 3150
Tel 8802 8818 Mob 0412 775 889 Email sandalmanagement@optusnet.com.au